# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**10 ශ්‍රේණිය**

**පළමු වාරය - පෙරදිග සංගීතය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | 1.0 සංගීතයේ මූලිකාංග ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 ආරෝහණයේ හා අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන / වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | <u>**භෛරවී රාගයේ ස්වර අභ්‍යාස**</u><br>* භෛරවී රාගාශ්‍රිත සරල ගීතයක් ශ්‍රවණයට සලස්වා රස විඳීමට යොමු කිරීම.<br>* ආරෝහණ අවරෝහණ ගයා පෙන්වීම.<br>* ඒ අනුව ස්වර අභ්‍යාස රටා ගොඩනැගෙන බව පැහැදිලි කිරීම.<br>* ස්වර අභ්‍යාස ලය තුනට අනුව තාලානුකූලව ගායනයට යොමු කිරීම. | 01<br>විනාඩි 40 | ජනවාරි 01 සතිය |
| | | | <u>**භෛරවී රාගයේ - සර්ගම්**</u><br>* සර්ගම් ගීතය ලියූ දෘශ්‍යාධාරය සිසුන් වෙත යොමු කිරීම.<br>* සර්ගම් ගීතය පෙළින් පෙළ ගායනය කර පෙන්වා සිසුන් සමඟ ගායනය හා වාදනය කිරීම.<br>* කණ්ඩායම් කරමින් ගායනය, වාදනය කරවීම. | 01<br>විනාඩි 40 | ජනවාරි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | <u>**භෛරවී රාගයේ ලක්ෂණ ගීතය**</u><br>* භෛරවී රාගය ආශ්‍රිත සරල ගීයක් ගායනය කර පෙන්වීම.<br>* භෛරවී රාගයේ ලක්ෂණ ගීතය ඇතුලත් ඇමුණුම ඇසුරින් රාගයේ ලක්ෂණ විස්තර කිරීම.<br>* ගීතය පෙළින් පෙළ ගයා පෙන්වා සිසුන් සමඟ ගායනය හා වාදනය කිරීම.<br>* ස්වර හා ගීතයේ වචන එකවර කණ්ඩායම් දෙකක් මඟින් ගායනයට යොමු කිරීම. | 01<br>විනාඩි 40 | ජනවාරි 02 සතිය |
| | | | <u>**භෛරවී රාගයේ මධ්‍යලය ගීතය**</u><br>* භෛරවී රාගාශ්‍රිත සරල ගීතයක් ශ්‍රවණයට සලස්වා ගුරුවරයා සිසුන් සමඟ සරල ගීතය ගයන්න.<br>* ගීතයේ රස භාවයන් පිළිබඳව කෙටියෙන් හැඳින්වීම.<br>* විවිධ ගීත කිහිපයක් ගායනය කර, රස කිහිපයක් භෛරවී රාගයෙන් ජනිත වන බව හා භක්ති ගී නිර්මාණයට මෙම රාගය භාවිතා කරන බව පැහැදිලි කිරීම.<br>* මධ්‍යලය ගීතය රසවත්ව ගායනය කර පෙන්වා ගීතය පාදයෙන් පාදය සාමූහිකව ගායනයට යොමු කිරීම.<br>* ස්වර ප්‍රස්තාරය ද ඒ ආකාරයෙන් ගායනයට / වාදනයට යොමු කිරීම. | 02<br>පැය 1 වි. 20 | ජනවාරි 02 සතිය |
| | | | * තහවුරු කිරීමේ ක්‍රියා | 01<br>විනාඩි 40 | ජනවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **<u>යමන් රාගයේ ස්වර අභ්‍යාස</u>**<br>* යමන් රාගය ආශ්‍රිත සරල ගීයක කොටසක් ගායනය කර පෙන්වීම.<br>* යමන් රාගාශ්‍රිත ස්වර අභ්‍යාස ඇතුළත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර රාගයේ ඇතුලත් තීව්‍ර මධ්‍යමය ස්වරය පිළිබඳව පැහැදිලි කිරීම.<br>* ශාස්ත්‍රීය ගායනයේ තානාලංකාර වල පවා ස්වර අභ්‍යාස භාවිතා කරන බව උදාහරණයක් මගින් ගායනය කර පෙන්වා දීම.<br>* යමන් රාගය ආශ්‍රිත ස්වර අභ්‍යාස පියවරෙන් පියවර ගායනයට යොමු කිරීම. | 01<br>විනාඩි 40 | ජනවාරි 03 සතිය |
| | | | **<u>යමන් රාගයේ සර්ගම්</u>**<br>* දෘශ්‍යාධාරය ඇසුරෙන් සර්ගම් ගීතය ගායනය කර පෙන්වීම.<br>* නාද මාලාව තහවුරු වනතෙක් පාදයෙන් පාදය ගායනයට යොමු කිරීම.<br>* සර්ගම් පිළිබඳව කෙටියෙන් හැඳින්වීම.<br>* සාමූහිකව හා කණ්ඩායම් කර ගායනයට යොමු කිරීම. | 01<br>විනාඩි 40 | ජනවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **<u>යමන් රාගයේ ලක්ෂණ ගී</u>** | 01 | ජනවාරි 04 සතිය |
| | | | * ගුරුවරයා විසින් ලක්ෂණ ගීතය රාග රස දනවන පරිදි ගායනය කර පෙන්වීම. | විනාඩි 40 | |
| | | | * ලක්ෂණ ගීත යන්න හඳුන්වා පද මාලාවෙන් කියවෙන අරුත සිසුන් සමඟ සාකච්ඡා කිරීම. | | |
| | | | * දෘශ්‍යාධාරය මඟින් ලක්ෂණ ගීතය හඳුන්වා පාදයෙන් පාදය ගායනයට යොමු කිරීම. | | |
| | | | * ස්ථායි, අන්තරා කොටස් වෙන් වෙන් වශයෙන් නාද මාලාව තහවුරු වන තෙක් ගායනයට යොමු කිරීම. | | |
| | | | * සාමූහිකව හා කුඩා කණ්ඩායම් ලෙස ගායනයට යොමු කිරීම. | | |
| | | | * මාසික පරීක්ෂණය | 01<br>විනාඩි 40 | ජනවාරි 04 සතිය |
| | | | * ක්‍රීඩා ප්‍රසංගය සඳහා පුහුණුව | 03<br>පැය 02 | ජනවාරි 04 සතිය<br>ජනවාරි 05 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **<u>යමන් රාගයේ මධ්‍යලය ගී</u>**<br>* යමන් රාගයට අදාල රාගාශ්‍රිත සරල ගීයක් ගායනා කර පෙන්වීම.<br>* සිසුන් සහභාගී කර ගනිමින් නැවත ගායනය කිරීම.<br>* ශාන්ත රසය, කරුණා රසය ඉස්මතු වන නිර්මාණ සඳහා යමන් රාගය සුදුසු බව ගී කොටස් කිහිපයක් ගායනය කරමින් පැහැදිලි කිරීම.<br>* දෘශ්‍යාධාරය මගින් මධ්‍යලය ගීතයේ ස්ථායි හා අන්තරා කොටස් ගායනය කර පෙන්වීම.<br>* පාදයෙන් පාදය නාද මාලාව තහවුරු වන සේ ගායනයට යොමු කිරීම.<br>* සාමුහිකව ගායනයට යොමු කිරීම.<br>* තබ්ලාව වාදනය කර එයට අනුගත වන සේ ගායනයට යොමු කිරීම.<br>* තහවුරු කිරීමේ ක්‍රියා | 02<br>පැය 1 වි. 20<br><br>01<br>විනාඩි 40 | පෙබරවාරි 01 සතිය<br><br>පෙබරවාරි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **<u>භෛරවී සහ යමන් රාගවල රාග විස්තර</u>**<br>* භෛරවී සහ යමන් රාගවල ලක්ෂණ ගී සිසුන් සමග ගායනය කිරීම.<br>* ලක්ෂණ ගී පදමාලාවල ගැබ් වී ඇති රාග ලක්ෂණ පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.<br>* රාග විස්තරයෙහි සඳහන් පාරිභාෂික පද පිළිබඳ සිද්ධාන්තික දැනුම අවබෝධ කරදීම හා කෙටි සටහන් ලියා ගැනීමට යොමු කිරීම.<br><br>* තහවුරු කිරීමේ ක්‍රියා<br>(කෙටි ප්‍රශ්න පත්‍රයක් යොමු කිරීම.) | 02<br>පැය 1 වි. 20<br><br>01<br>විනාඩි 40 | පෙබරවාරි 02 සතිය<br><br>පෙබරවාරි 03 සතිය |
| **02** | 2.0 වාද්‍ය භාණ්ඩයන් හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 ස්වර ලිපි බලා වාදනය කරයි. | **<u>ස්වර ලිපි කියවීමේ ශිල්ප ක්‍රම</u>**<br>* තෝරාගත් ගීතයක ස්වර ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කර එය වාදනය කර පෙන්වීම හා එහි ඇති විවිධ සංකේත පිළිබඳව සිසුන් ට පැහැදිලි කිරීම.<br>* ගුරු අත්පොත් සඳහන් ඇමුණුම 01 සිසුන්ට යොමු කර එහි ඇති තොරතුරු ගවේශණයට යොමු කිරීම.<br>* ඇමුණුමේ ඇති සංකේත හා උදාහරණ ප්‍රායෝගිකව සිසුන්ට පැහැදිලි කිරීම හා සිසුන්ට වාද්‍ය භාණ්ඩ වලින් වාදනය කිරීමට සැලැස්වීම.<br>* එම සංකේත අභ්‍යාස පොතෙහි සටහන් කර ගැනීමට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20 | පෙබරවාරි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **<u>තනුවක් ස්වර ලිපි කිරීමේ ශිල්ප ක්‍රම</u>** | 02<br>පැය 01 වි. 20 | පෙබරවාරි 04 සතිය |
| | | | * එකම ස්වර නැවත නැවත යෙදෙන ගීතයක් වාදනය කර ශ්‍රවණයට සැලැස්වීම. | | |
| | | | * තනුවක් ස්වර ලිපි කිරීම සඳහා අවශ්‍ය මූලික කරුණු පැහැදිලි කිරීම. | | |
| | | | * ගුරුවරයා මුලින් වාදනය කළ ගීතය නැවත ශ්‍රවණයට සලස්වා එය ප්‍රස්ථාර කිරීම සිසුන් යොමු කිරීම. | | |
| | | | * සිසුන් ප්‍රස්ථාරයට නැගු ගීතය වාද්‍ය භාණ්ඩයකින් වාදනය කර සදොස් තැන් ඇතොත් නිදොස් කරවීම. | | |
| | | | * තහවුරු කිරීමේ ක්‍රියා | | මාර්තු 01 සතිය |
| | | | * මාසික පරීක්ෂණය | 01 (වි. 40) | මාර්තු 01 සතිය |
| | | | | 01 (වි. 40) | |
| | | | * කලාප සංගීත තරග සඳහා පුහුණුව | | මාර්තු 01 සතිය |
| | | | | 04<br>පැය 02 වි. 40 | මාර්තු 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | <u>**ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය**</u><br>* ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් සරල ගීතයක් වාදනය කර පෙන්වීම.<br>* ස්වර පුවරු වාදනය ප්‍රගුණ කිරීම තුලින් ලැබෙන දැනුම, කුසලතා, රසවින්දනය පිළිබඳව සිසුන්ට කරුණු පැහැදිලි කිරීම.<br>* ස්වර පුවරු භාණ්ඩ වාදනයේ දී දෑත නිවැරදිව හසුරුවන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම.<br>* සරල තනු ඇතුළත් ගීත පළමුව වාදනයට යොමු කර පෙරවාදන, අතුරු වාදන සහිතව ගීත වාදනය කිරීමට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20 | මාර්තු 03 සතිය |
| | | | <u>**තෝරාගත් භාණ්ඩයෙන් ස්වර ලිපි බලා වාදනය**</u><br>* දක්ෂ සංගීතඥයෙකුගේ වාදනයක් ශ්‍රවණයට සැලසීම.<br>උදා :- යානී සංගීතඥයා / රවි ශංකර් වැනි | 02<br>පැය 01 වි. 20 | මාර්තු 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | * වාදන ශිල්පියෙක් වීමේදී ස්වර ලිපි කියවීමේ හැකියාව මෙන්ම අතැඟිලි නිවැරදිව හැසිරවීමේ වැදගත්කම පිළිබඳව සිසුන්ට පැහැදිලි කිරීම.<br>* සරල ස්වර ප්‍රස්තාර සිසුන් අතට යොමුකර වාදනය කිරීමට යොමු කිරීම.<br>* සිසුන්ගේ දක්ෂතා අනුව වර්ග කර සුදුසු ගීත ප්‍රස්තාර ලබා දී වාදනය පුහුණු කිරීම. | | |
| | | | * තහවුරු කිරීමේ ක්‍රියා | 01<br>විනාඩි 40 | මාර්තු 04 සතිය |
| | | | * මාසික පරීක්ෂණය | 01<br>විනාඩි 40 | මාර්තු 04 සතිය |
| | | | * වාර පරීක්ෂණය සඳහා | 06<br>පැය 04 | මාර්තු 04 සතිය<br>අප්‍රේල් 01, 02 සතිය |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**10 ශ්‍රේණිය**

**දෙවන වාරය - පෙරදිග සංගීතය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | 3.0 සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරුවෙයි. | 3.1 ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ / වාදනය කරමින් රසාස්වාදයේ යෙදෙයි. | <u>ග්‍රැමෆෝන් තැටි යුගයෙන් තෝරාගේ ගීතයක්</u><br>* යුග 3 ට අයත් ගීත කීපයක් සිසුන්ට ශ්‍රවණයට සැලසීම.<br>* එක් එක් යුගවලට අයත් ගීත පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>* ග්‍රැමෆෝන් තැටි යුගය පිළිබඳ විස්තර පත්‍රිකාවක් ලබාදීම හා ග්‍රැමෆෝනයේ පින්තූරයක් හෝ තැටියක් ප්‍රදර්ශනය කිරීම.<br>* ගීතය ලියූ දෘශ්‍යාධාරය ඇසුරෙන් තෝරාගත් ගීතයක් සිසුන් සමඟ ගායනය කිරීම. | 02<br>පැය 01 වි. 20 | අප්‍රේල් 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **ස්වාධීන තැටි යුගයට අයත් ගීත**<br>* ස්වාධීන තැටි යුගයට අයත් ආනන්ද සමරකෝන් හා සුනිල් සාන්ත ශූරීන්ගේ ගීත 02 ක් ශ්‍රවණයට සැලසීම.<br>* ගීත පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>* ගුවන්විදුලි සරල ගී සඳහා දායක වූ ශිල්පීන් පිළිබඳව දැනුවත් කිරීම.<br>* ගීත දෙකක දෘශ්‍යාධාර සපයා ගනිමින් වාදන භාණ්ඩ සහිතව සිසුන් සමඟ ගායනා කිරීම.<br>* මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීතයේ ස්වභාවය සාකච්ඡා කිරීම.<br>* කණ්ඩායම් ලෙස ගීත 02 ක ගායනයට අවස්ථාව සලසා දීම. | 02<br>පැය 01 වි. 20 | අප්‍රේල් 04 සතිය |
| | | | **කපිරිඤ්ඤා ගීතවල ස්වභාවය**<br>* කපිරිඤ්ඤා ගී තනු ඇසුරින් නිර්මිත සරල ගී 02 ක් ශ්‍රවණයට සැලසීම.<br>* වාද්‍ය භාණ්ඩ සහිතව දරුවන් සමඟ ගායනය කිරීම.<br>* "තැර ඉස්ති තැර" යන ගීතය ගයා වයා පෙන්වීම හා සිසුන් සමඟ ගායනය කිරීම.<br>* එම ගීතවල ඇති සුවිශේෂතා සාකච්ඡා කිරීම. | 02<br>පැය 01 වි. 20 | අප්‍රේල් 04 සතිය<br>මැයි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **02** | 2.0 වාද්‍ය කාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 2.1 ස්වර ලිපි බලා වාදනය කරයි. | **ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය**<br>* ස්වර වාද්‍ය භාණ්ඩ හා වාදන ඉරියව් ප්‍රදර්ශනය කිරීම.<br>* ස්වර පුවරු භාණ්ඩ වාදනය කරන අවස්ථා නැරඹීමට සැලසීම.<br>* විවිධ සංකේත ඇතුලත් ස්වර ප්‍රස්තාරයක් ප්‍රදර්ශනය කිරීම හා වාදනයට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20 | මැයි 01 සතිය |
| | | | **තෝරාගත් භාණ්ඩයන් හි ස්වර ලිපි බලා වාදනය**<br>* සිසුන් විසින් තෝරාගත් භාණ්ඩය මගින් ඉහත සඳහන් ගීත හෝ වෙනත් ගීතයක් වාදනයට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20 | මැයි 02 සතිය |
| | | | * මාසික පරීක්ෂණය | 01<br>විනාඩි 40 | මැයි 02 සතිය |
| | | | * රාජ්‍ය උත්සව සඳහා ප්‍රසංග පුහුණු කිරීම් | 02<br>පැය 01 වි. 20 | මැයි 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **03** | 4.0 දේශීය ජන සංගීතය පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනී. | 4.1 සිංහල පද්‍ය ගායනාවන් හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි. | **<u>සේ ගී වල ස්වභාවය හා සැළලිහිණි සංදේශයේ, ගුත්තිලයේ කාව්‍ය ගායනා</u>**<br>* සේ ගී ඇතුළත් ශ්‍රව්‍ය පටයක් ශ්‍රවණයට සැලසීම. (පැහැසරණිය)<br>* එම ගීතයේ ඇතුළත් කාව්‍යාලංකාර පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br><br>**<u>ගීත 02 ක් ගායනය</u>**<br>* ඉහත සඳහන් කළ කාව්‍යයන් හි ගීත 02 ක් ගායනා කර පියවරෙන් පියවර ගායනයට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20<br><br><br><br>02<br>පැය 01 වි. 20 | මැයි 03 සතිය<br>මැයි 04 සතිය<br><br><br><br>මැයි 04 සතිය |
| | | 4.2 ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | **<u>ජන ගී වර්ගීකරණය හා විවිධ වර්ගයේ ජන ගී (මෙහෙ ගී, බැති ගී, සමාජ ගී, සේ ගී)</u>**<br>* ජන ගී වර්ගීකරණය ගැලීම් සටහනකින් ප්‍රදර්ශනය කිරීම.<br>* ගුරුවරයා විසින් සාම්ප්‍රදායික නාදමාලාව ගායනය කර පෙන්වීම හා සිසුන්ට අවස්ථාව ලබා දීම.<br>* ජන ගී වර්ගීකරණය පිළිබඳ සිසුන් සමඟ කෙටියෙන් සාකච්ඡා කිරීම.<br>* තෝරාගත් ජන ගී වල නාද මාලා සිසුන් සමඟ ගායනා කරමින් නාද මාලා තහවුරු කිරීම. | 02<br>විනාඩි 40 | ජුනි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **ආසාතාත්මක බැති ගී හා කෙළි ගී**<br>* ගී වර්ග 02 හඳුන්වා දීම.<br>* තෝරාගත් ගී ගුරුවරයා විසින් ගයා ශ්‍රවණයට සැලසීම.<br>* නාද මාලා තහවුරු වන තෙක් පාදයෙන් පාදය ගායනය කරවා සාමූහික ව ගායනය කිරීම. | 02<br>පැය 01 වි. 20 | ජුනි 01 සතිය |
| | | | **අනාසාතාත්මක ගී ගායනය**<br>* අනාසාතාත්මක ගීයක් ගායනා කර පෙන්වා අනාසාතාත්මක ගී හඳුන්වා දීම.<br>* ශ්‍රව්‍ය දෘශ්‍ය පට මාර්ගයෙන් මෙහෙ ගී කීපයක් නැරඹීමට හා ශ්‍රවණයට සැලසීම.<br>* තෝරාගත් මෙහෙ ගී කීපයක් ගායනයට පුහුණු කිරීම. | 02<br>පැය 01 වි. 20 | ජුනි 02 සතිය |
| | | | * නැවත ගායන පුහුණුව | 01<br>විනාඩි 40 | ජුනි 02 සතිය |
| | | | * තහවුරු කිරීමේ ක්‍රියා | 01<br>විනාඩි 40 | ජුනි 03 සතිය |
| | | | * මාසික පරීක්ෂණය | 01<br>විනාඩි 40 | ජුනි 03 සතිය |
| | | | * පළාත් සංගීත තරග සඳහා පුහුණුව | 02<br>පැය 01 වි. 20 | ජුනි 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **04** | 6.0 රංග සම්ප්‍රදායන් හි විශේෂතා අධ්‍යයනය කරමින් සංගීතමය ලක්ෂණ පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබයි. | 6.1 විවිධ ශෛලීන් ආභාෂය කරගත් නව නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කර ගනිමින් ගායනයේ යෙදෙයි. | **නව නාට්‍ය ගී සඳහා නාඩගම් ශෛලියේ ආභාෂය ලැබීම.**<br>* සිංහබාහු, කාලගෝල, මනමේ ගීත ඇතුලත් CD පට නැරඹීමට සැලැස්වීම.<br>* ඉහත නාට්‍ය ගී අතරින් කැමති ගීයක් ගෙන ගායනය කරමින් රංගනයක යෙදීමට අවස්ථාව ලබා දීම.<br>* ඇමුණුම 1 අනුව පැරණි නාඩගම් ගී හා නව නාට්‍ය ගී පිළිබඳ සාකච්ඡා කිරීම. | 01<br>විනාඩි 40 | ජුනි 04 සතිය |
| | | | **නව නාට්‍ය ගී ගායනය**<br>* නාඩගම් ගීතයක් රංගෝචිතව ගයා වයා සිසුන්ට නැරඹීමට සැලැසීම.<br>* සිංහබාහු, මනමේ නව නාට්‍ය වලින් ගීතය බැගින් ගෙන සිසුන්ට පුහුණු කිරීම. | 02<br>පැය 01 වි. 20 | ජුනි 04 සතිය<br>ජූලි 01 සතිය |
| | | | * කාලගෝල නව නාට්‍යයේ එන ගීයක් ගායනය කර සිසුන්ට ශ්‍රවණයට සැලසීම.<br>* ගීතය සිසුන්ට පුහුණු කිරීම. | 01<br>විනාඩි 40 | ජූලි 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | 1.0 සංගීතයේ මූලිකාංග ශිල්පාංග හා සිද්ධාන්ත හඳුනාගනිමින් ගායන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.2 හින්දුස්ථානි තාල පද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත්වන අයුරු විමර්ෂනය කරමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | <u>**හින්දුස්ථානි තාලපද වල අවනද්ධාක්ෂර**</u><br>* තබ්ලා වාදන අංග ඇතුළත් වාදන අවස්ථාවක් සිසුනට නැරඹීමට සැලැස්වීම.<br>* හස්ත සාධන අභ්‍යාස ඇතුළත් වීඩියෝ පට නැරඹීමට සැලැස්වීම.<br>* හස්ත සාධන අභ්‍යාස වාදනයට හුරු කරවීම හා සරල තාල පද වාදනයට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20<br><br>02<br>පැය 01 වි. 20 | ජූලි 01 සතිය<br>ජූලි 02 සතිය<br><br>ජූලි 02 සතිය |
| | | 3.2 ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි. | <u>**W.B. මකුලොළුව මහතා, සී ද ඇස් කුලතිලක මහතා**</u><br>* ඉහත සංගීතඥයින්ගේ ගීතයක් බැගින් ගෙන ගායනා කරමින් ශ්‍රවණයට සැලසීම.<br>* එම ගීත සාමූහිකව සිසුන් සමඟ ගායනා කිරීම.<br>* දෘශ්‍යාධාරය මගින් එම ගීත ලියා ගැනීමට සැලැස්වීම.<br><br>* ඉහත නිර්මාණකරුවන්ගේ ජීවන තොරතුරු සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>* ඔවුන්ගේ නිර්මාණ ග්‍රන්ථ හා කරන ලද සේවාවන් සාකච්ඡා කිරීම.<br>* ඉහත දක්වන ලද තොරතුරු සියල්ල වගුගත කිරීමට යොමු කිරීම.<br>* වාර පරීක්ෂණ සඳහා | 01<br>විනාඩි 40<br><br>01<br>විනාඩි 40<br><br>05 | ජූලි 03 සතිය<br><br>ජූලි 03 සතිය<br><br>ජූලි 03, 04, 05 සති |

## දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**පළමුවන අදියර**

**10 ශ්‍රේණිය**

**තෙවන වාරය - පෙරදිග සංගීතය**

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| **01** | 9.0 සංගීතයේ තාක්‍ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 9.1 නාදයේ විවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි. | **<u>නාද නිෂ්පත්තිය හා ප්‍රගමණය</u>**<br>* දෘශ්‍යාධාර මගින් නාද තරංගයක හා ශබ්ද තරංගයක වෙනස පෙන්වීම.<br>* ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් ශබ්ද හා නාද අතර ඇති වෙනස හඳුනා ගැනීමට සැලසීම.<br>* සෞන්දර්ය විෂයන්හි මාධ්‍යයන් සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>* නාදය හා සම්බන්ධ පාරිභාෂික වචන ක්‍රියාකාරකම් ඇසුරින් පැහැදිලි කිරීම. | 02<br>පැය 01 වි. 20 | සැප්තැම්බර් 01 සතිය |
| | | | **<u>නාදයේ ත්‍රිවිධ ගුණ</u>**<br>* නාදයේ ගුණ 03 ට අදාළ ක්‍රියාකාරකම් සිසුන් කණ්ඩායම් 03 කට බෙදා කරවීම.<br>* එක් එක් කණ්ඩායමට පන්තිය ඉදිරියට පැමිණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදී ගුරුවරයා ද ඊට සහාය දක්වා එම ගුණ ඇතිවීමට හේතු සාකච්ඡා කරන්න. | 02<br>පැය 01 වි. 20 | සැප්තැම්බර් 01 සහ 02 සතිය |
| | | | * ත්‍රිවිධ ගුණ පිළිබඳ සටහනක් ගොඩ නගන්න. | 01<br>වි. 40 | සැප්තැම්බර් 02 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | <u>**සප්තකයේ ස්වර සංඛ්‍යාත**</u><br>* ස්වර සප්තකය ආරෝහණ අවරෝහණ වශයෙන් ගයා වයා පෙන්වීම. ස්වර ඉහළ පහළ වන අයුරු සිසුන් සමඟ සාකච්ඡා කිරීම.<br>* ස්වර වල සංඛ්‍යාත ඇතුළත් දෘශ්‍යාධාරය ඇසුරින් සප්තකයේ ස්වර වල සංඛ්‍යාතයන් අධ්‍යයනය කිරීමට යොමු කිරීම.<br>* රාජ්‍ය උත්සව සඳහා ප්‍රසංග පුහුණුව | 02<br>පැය 01 වි. 20<br><br><br><br><br><br>04 | සැප්. 02 සතිය<br>සැප්. 03 සතිය<br><br><br><br><br><br>සැප්. 03 සතිය<br>සැප්. 04 සතිය |
| **02** | 5.0 ව්‍යවහාරික සංගීතය හා බැඳි සංගීතාංග පිළිබඳව අත්දැකීම් ලබයි. | 5.1 උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණකරණයේ රාගධාරී පසුබිම සාකච්ඡා කරමින්, රස විඳිමින් ගීත ගායනයේ යෙදෙයි. | <u>**ගයා වයා විඳිමු හින්දි චිත්‍රපට ගී**</u><br>* DVD, CD, VCD ආදී උපාංගයක් මගින් නිර්දේශිත හින්දි චිත්‍රපට ගී කීපයක් ශ්‍රවණයට සැලසීම.<br>* තෝරාගත් ගීතයේ දෘශ්‍යාධාරය මගින් ගායනයට හුරු කිරීම.<br>* විවිධ උපක්‍රම මගින් හා සිසුන්ට ගැලපෙන ක්‍රමවේදයන් අනුව ගායනය කරවීම.<br>* සාමූහිකව හා කණ්ඩායම් කර ගායනය කරවා තනිව ගායනය කරවීම හා සදොස් තැන් නිදොස් කරවීම. | 02<br>පැය 01 වි. 20<br><br><br><br><br><br>01<br>විනාඩි 40 | සැප්. 04 සතිය<br>ඔක්. 01 සතිය<br><br><br><br><br><br>ඔක්. 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | <u>**ගයා වයා විඳිමු මව්පිය ගුණවරුණ ගී**</u><br>* මව්පිය ගුණ ඇතුලත් ගීත ලැයිස්තුවක් සිසුන් වෙත ඉදිරිපත් කර සිසුන් කැමති ගීතයක් ශ්‍රවණයට සැලසීම.<br>* සිසුන් තෝරාගත් ගීතය සිසුන්ට ග්‍රහණය වන සේ ගායනය කරවීම.<br>* වාදනයට දක්ෂ ළමුන් යොදා ගනිමින් ගීතය ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම. | 02<br>පැය 01 වි. 20<br><br>01<br>විනාඩි 40 | ඔක්. 01 සතිය<br>ඔක්. 02 සතිය<br><br>ඔක්. 02 සතිය |
| | 7.0 සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි. | 7.1 ගී පද රචනාවක සුවිශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් ගී පද නිර්මාණය කර තනු නිර්මාණය කරයි. | <u>**ගී පද නිමවුම**</u><br>* සාර්ථක ගී පදමාලා ඇතුළත් ගීත කීපයක් ශ්‍රවණයට සැලසීම.<br>* පද මාලාවක අඩංගු විය යුතු සුවිශේෂී අංග පැහැදිලි කිරීම.<br>* සිසුන් කණ්ඩායම් කර මාතෘකා කීපයකට අදාළ පද මාලා නිර්මාණයට යොමු කිරීම.<br><br><u>**සුදුසු තනු නිර්මාණය කිරිම.**</u><br>* තනු නිර්මාණයක අවශ්‍ය වන අංග වන මූලික රිද්මය, ශ්‍රැතිය, කෙටි සංගීත කොටස් පිළිබඳ සිසුන් දැනුවත් කර එම කොටස් පිළිබඳ අවබෝධය සඳහා නැවත ගීතයක් ශ්‍රවණයට සැලසීම. | 01<br>විනාඩි 40<br><br>02<br>පැය 01 වි. 20 | ඔක්. 02 සතිය<br><br>ඔක්. 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | **<u>කවියක් ගීතයක් කිරීම.</u>**<br>* සිසුන් විසින් ලියන ලද පද නිර්මාණ සඳහා සරල තනුවක් නිර්මාණයට යොමු කිරීම.<br>* භාවිතයේ පවතින කවි ඇසුරින් ගීතයක් නිර්මාණය කරගත් අවස්ථා පැහැදිලි කිරීම.<br>උදා :- රෑ රැසේ අඳිනා ...<br>තෙල් ගාලා හිස<br>* සිසුන් කණ්ඩායම් කර පාද 04 කින් යුත් කවියක් සිසුන් අතර බෙදා දී තනු නිර්මාණයට සැලසීම. | 02<br>පැය 01 වි. 20 | ඔක්. 03 සතිය<br>ඔක්. 04 සතිය |
| | 8.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 8.1 ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි. | **<u>ජප් තාල්, දීප්චන්දි යන තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම.</u>**<br>* එම තාල මත පදනම් වූ ගීත 02 ක් ශ්‍රවණයට සැලසීම.<br>* ඉහත තාල 02 මත නිර්මාණය වූ ගීත කීපයක් ගුරුවරයා ගායනා කර එහි රිද්ම රටාවට අතින් තාල දැමීමට යොමු කිරීම.<br>* ඒ අනුව තාල දෙකට අදාළ ගීත ප්‍රස්තාර කරවීම. | 02<br>පැය 01 වි. 20 | ඔක්. 04 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි. | **<u>සමග්‍රහ විෂමග්‍රහ, අවග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කිරීම.</u>**<br>* ග්‍රහ යන්න හඳුන්වා සමග්‍රහ, විෂමග්‍රහ සහ අවග්‍රහ පැහැදිලි කිරීම.<br>* ඉහත ග්‍රහ 03 ට අදාළ ගීත 03 ක් ගෙන ශ්‍රවණයට සලස්වා සිසුන් හට තාල තැබීමට යොමු කිරීම.<br>* එම ගීතවල පළමු පාදය ප්‍රස්තාරගත කිරීමට සැලැස්වීම. | 01<br>විනාඩි 40 | ඔක්. 05 සතිය |
| | 9.0 සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 9.1 සංගීත අධ්‍යයනයේ, නිර්මාණකරනයේ සහ සංරක්ෂණයේදී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම් වල යෙදෙයි. | **<u>E – Learning, E – Encyclopedia, E – Music (MIDI)</u>**<br>* ඉහත විද්‍යුත් විශ්ව කෝෂ කෙටියෙන් පැහැදිලි කිරීම.<br>* පරිගණකය ආශ්‍රිතව, පරිගණකයේ කොටස් නම් කල දෘශ්‍යාධාරය ඇසුරු කර ගෙන පාඩම හැඳින්වීම.<br>* කාර්ය පත්‍රිකා උපයෝගී කර ගනිමින් පරිගණකය ආශ්‍රිතව නිර්මාණයන් කිරීමට සිසුන්ව යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20 | ඔක්. 05 සතිය<br>නොවැ. 01 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | | | * පරිගණකය මගින් නූතන යතුරු පුවරුව සංගීත භාණ්ඩ යොදාගනිමින් සම්පූර්ණ වාදක මණ්ඩලයක අවශ්‍යතා ඉටුකරගත හැකි බව අදාල ක්‍රියාකාරකම් ඇසුරින් අවබෝධ කර ගැනීමට සැලැස්වීම. MIDI යන්න හැඳින්වීම.<br>* Riping Music with Computer මෙහි අදහස පැහැදිලි කර දීම.<br>* CD, VCD, MP3, Blue Ray තැටි මගින් සංගීතය ශ්‍රවණය කිරීමට අවශ්‍ය උපකරණ පිළිබඳව හා ඒවා පරිගණකය හරහා යොදාගන්නා ආකාරය ක්‍රියාකාරකම් ඇසුරින් පැහැදිලි කිරීම. | 02<br>පැය 01 වි. 20 | නොවැ. 02 සතිය |
| | | | **<u>අන්තර්ජාලය ඇසුරින් සංගීතය ඉගෙන ගැනීම හා සෙවීම.</u>**<br>* ලෝකයේ තොරතුරු ගවේශණ මාධ්‍ය පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.<br>* වර්තමානයේ තොරතුරු ගවේශණය සඳහා සුදුසුම මාධ්‍ය අන්තර්ජාලය බව පැහැදිලි කිරීම.<br>* You Tube භාවිතා කරමින් ඉගි වලට අදාළ තොරතුරු ගවේෂණයට යොමු කිරීම. | 02<br>පැය 01 වි. 20 | නොවැ. 02 සතිය<br>නොවැ. 03 සතිය |

| අනු අංක | නිපුණතාවය | නිපුණතා මට්ටම | ක්‍රියාකාරකම | කාලච්ඡේද හා පැය ගණන | පාඩම නිමකළ යුතු කාල පරාසය |
|---|---|---|---|---|---|
| | 3.0 සංගීතයේ රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි. | 3.2 ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි. | **<u>ලයනල් රන්වල හා රෝහණ බැද්දගේ යන සංගීතඥයින්</u>**<br>* ඉහත ශිල්පීන්ගේ තෝරාගත් ගීත 02 ක් ගයා ශ්‍රවණයට සැලසීම.<br>* ඉහත සංගීතඥයින් දෙදෙනාගේ ජීවන තොරතුරු, සංගීතමය ගැලපීම් භාණ්ඩ උපයෝගීතාවය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කිරීම.<br>* අදාළ සටහන ගොඩ නැගීම. | 02<br>පැය 01 වි. 20 | නොවැ. 03 සතිය |
| | | 3.3 උතුරු ඉන්දීය අධ්‍යතන ශාස්ත්‍රීය සංගීතඥයින් හඳුනාගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි. | **<u>හරිප්‍රසාද් චෞරසියා, රවි ශංකර්, ශකීර් හුසේන් සංගීතඥයින්</u>**<br>* ඉහත භාරතීය වාද්‍ය ශිල්පීන්ගේ නිර්මාණයන්ගෙන් කොටස බැගින් ශ්‍රවණයට සලසා එම නිර්මාණ පිළිබඳව සාකච්ඡා කිරීම.<br>* ඔවුන්ගේ ජීවන තොරතුරු, නිර්මාණ පිළිබඳව, පෞරුෂ ගුණාංග ආදිය පැහැදිලි කර සටහන ගොඩනගා ගැනීමට උදව් දීම.<br>**<u>ජග්ජිත් සිංග්, ඒ.ආර්. රහුමාන්</u>**<br>* මෙම සංගීතඥයින්ගේ නිර්මාණ රස විඳීමට අවස්ථාව සලසා දීම.<br>* ඒ පිළිබඳව සිසුන් සමග සාකච්ඡා කිරීම.<br>* ඔවුන්ගේ ජීවන තොරතුරු පෞරුෂ ගුණාංග පිළිබඳව පැහැදිලි කර සටහන ගොඩ නැගීම.<br>* වාර පරීක්ෂණය සඳහා | 02<br>පැය 01 වි. 20<br>05 | නොවැ. 04 සතිය<br>නොවැ. 04 සතිය<br>දෙසැ. 01 සතිය |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**
**10 ශ්‍රේණිය**

**පළමු වාරය - පෙරදිග සංගීතය**

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **01** | ආරෝහණයේ හා අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන / වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | * භෛරවී රාගය - ස්වර අභ්‍යාස | ප්‍රායෝගික ක්‍රමය | නිදහස් කාලච්ඡේද වලදී පුහුණු වන්න. | භෛරවී රාගයට අදාළ ස්වර අභ්‍යාස 05 ක් ගොඩ නගන්න. | ලියන ලද ස්වර අභ්‍යාස ඇගයීම. |
| | | * භෛරවී රාගය - සර්ගම් | අනුකරණ ක්‍රමය | භෛරවී රාගයේ සර්ගමය කණ්ඩායම් වශයෙන් පුහුණුවන්න. | භෛරවී රාලයට අදාළ ස්වර ඛණ්ඩ ඇතුළත් සටහනක් සාදන්න. | තනි තනිව ගායනය කරවීම. |
| | | * භෛරවී රාගය - ලක්ෂණ ගී | ප්‍රායෝගික ක්‍රමය | නිදහස් කාලච්ඡේද වලදී පුහුණුවන්න. | ලක්ෂණ ගීතය අනුව රාග විස්තර ලියා දක්වන්න. | රාග විස්තර ලියූ පත්‍රිකාව |
| | | * භෛරවී රාගය - මධ්‍යලය ගී | ප්‍රායෝගික ක්‍රමය | භෛරවී රාගය ආශ්‍රිත සරල ගී සමඟින් මධ්‍යලය ගීතය පුහුණුවන්න. | භෛරවී රාගය ආශ්‍රිත සරල ගී ලැයිස්තුවක් සාදන්න. | සරල ගී ලැයිස්තුව නිවැරදි දැයි බැලීම. |
| | | * යමන් - ස්වර අභ්‍යාස | අනුකරණ ක්‍රමය | කණ්ඩායමක් ලෙස ස්වර අභ්‍යාස පුහුණු වන්න. | තීව්‍ර මධ්‍යමය ඇතුළත් ස්වර අභ්‍යාස 05 ක් ගොඩනගන්න. | ස්වර අභ්‍යාස ගායනය කරවීම. |
| | | * යමන් - ලක්ෂණ ගී | ප්‍රායෝගික ක්‍රමය | වෙනත් ලක්ෂණ ගීතයක් සොයන්න. | ලක්ෂණ ගීතයේ සඳහන් තොරතුරු ලියන්න. | රාග විස්තර ඇතුළත් පත්‍රිකාව |
| | | * යමන් - සර්ගම් | ප්‍රායෝගික ක්‍රමය | නිදහස් කාලච්ඡේදවලදී පුහුණුවන්න. | සර්ගමයේ සඳහන් රාග සංගති 05 ක් ලියන්න. | රාග සංගති නිවැරදි දැයි බැලීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| | | * යමන් - මධ්‍යලය ගී | අනුකරණ ක්‍රමය | මධ්‍යලය ගී සඳහා යෙදෙන වෙනත් ගී සොයන්න. | මධ්‍යලය ගීතයේ සඳහන් ස්වර සංගති ලියන්න. | ඒකලව ගායනය ගැනීම. |
| | | * භෛරවී - යමන් රාග විස්තර | සාකච්ඡා ක්‍රමය<br>ප්‍රායෝගික ක්‍රමය | සාමූහිකව පුහුණුවීමට උපදෙස් දීම. | යමන් හා භෛරවී රාග විස්තර වගුවකට ගොඩ නගන්න. | කෙටි ප්‍රශ්න පත්‍රයක් ලබා දීම. |
| **02** | ස්වර ලිපි බලා වාදනය කරයි. | ස්වර ලිපි කියවීමේ ශිල්ප ක්‍රම | ප්‍රායෝගික ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය | වෙනත් ස්වර ප්‍රස්තාර සොයා පාඩමේ සඳහන් සංකේත සොයන්න. | ජනප්‍රිය ගීත ස්වර ප්‍රස්තාරයක් ගෙන එහි ඇති සංකේත ලියා ගෙන එන්න. | ස්වර ලිපියක් දී ස්වර පුවරුවෙන් වාදනය කරවීම. |
| | | තනුවක් ස්වර ලිපි කිරීමේ ශිල්ප ක්‍රම | ප්‍රායෝගික ක්‍රමය | කුඩා ගීත කීපයක ස්වර ප්‍රස්තාර ලිවීමට යොමු කිරීම. | අසා ඇති ගීතයක ස්වර ප්‍රස්තාරය ලියන්න. | ස්වර පුවරුවෙන් වාදනය කිරීමට යොමු කිරීම. |
| | | ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය | ප්‍රායෝගික ක්‍රමය | ස්වර පුවරු වාදන ඇතුලත් CD වාදන අසන්න. | ස්වර ලිපි 02 ක් ස්වර පුවරුවෙන් වාදනය කිරීමට පුහුණුවන්න. | ස්වර පුවරුවෙන් වාදනය කරවීම. (ස්වර ලිපියක්) |
| | | තෝරාගත් භාණ්ඩයෙන් ස්වර ලිපි බලා වාදනය | ප්‍රායෝගික ක්‍රමය | නිවැරදි ශිල්ප ක්‍රම භාවිතා කරමින් තෝරාගත් භාණ්ඩය පුහුණුවන්න. | ස්වර ලිපියක ඇති සංකේත වලට අවධානය යොමු කරමින් ගීතයක් වාදනය කරන්න. | ස්වර ලිපිය අනුව සංකේත භාවිතය නිවැරදි දැයි බැලීම. |

# දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**
**10 ශ්‍රේණිය**

**දෙවන වාරය - පෙරදිග සංගීතය**

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| 03 | ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනා ගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ, රසාස්වාදයේ යෙදෙයි. | ග්‍රැමෆෝන් තැටි යුගයෙන් තෝරාගත් ගීතයක් ගායනය | ප්‍රායෝගික ක්‍රමය | සුනිල් ආරියරත්න ශූරීන්ගේ ග්‍රැමෆෝන් ගී පිළිබඳ කෘතිය විමර්ශනය කරන්න. | ග්‍රැමෆෝන් ගී ලැයිස්තුවක් ලියන්න. | ගීතය ගායනා කරවීම. |
| | | ග්‍රැමෆෝන ගී පිළිබඳ සංස්කෘතික පසුබිම | සාකච්ඡා ක්‍රමය | මේ පිළිබඳ ලියා ඇති ලිපි සොයන්න. | පුවත්පත් ආදියෙහි පළවන ලිපි සොයා ගොනුවක් සකස් කරන්න. | කෙටි ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලියවීම. |
| | | ස්වාධීන තැටි යුගයට අයත් ගීත | සාකච්ඡා ක්‍රමය<br>ප්‍රායෝගික ක්‍රමය | ගුවන් විදුලි සංස්ථාවෙන් පළවන ගුවන් විදුලි සඟරා කියවන්න. | සුනිල් ශාන්ත හා ආනන්ද සමරකෝන් මහතුන් පිළිබඳ කරුණු රැස් කරන්න. | ගීත 02 ක් ගායනය කරවීම. |
| | | කපිරිඥ්ඥා ගීතවල ස්වභාවය | ප්‍රායෝගික ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය | සුනිල් ආරියරත්නයන්ගේ බයිලා කපිරිඥ්ඥා පොත කියවන්න. | කපිරිඥ්ඥා ගීතවල ලක්ෂණ පිළිබඳ පුවත්පතකට ලිපයක් සකස් කරන්න. | කපිරිඥ්ඥා ගීතය ගායනා කරවීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **04** | ස්වර ලිපි බලා වාදනය කරයි. | ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය | ප්‍රායෝගික ක්‍රමය<br>අනුකරණ ක්‍රමය | නැවත නැවත පුහුණුවීම් කරන්න. | විවිධ සංකේත ඇතුළත් ස්වර ලිපියක් වාදනය කිරීමට පුරුදු වන්න. | ස්වර පුවරුවෙන් ස්වර ලිපියක් වාදනය කරවීම. |
| | | තෝරාගත් භාණ්ඩයන් හි ස්වර ලිපි බලා වාදනය | ප්‍රායෝගික ක්‍රමය | නිදහස් කාලච්ඡේද වලදී වාද්‍ය භාණ්ඩ පුහුණුවන්න. | තෝරාගත් භාණ්ඩයේ ස්වර ප්‍රස්තාර වාදනය කර හුරු වන්න. | ස්වර ලිපියක් තෝරාගත් භාණ්ඩයෙන් වාදනය කරවීම. |
| **05** | සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි. | සේ ගී වල ස්වභාවය | සාකච්ඡා ක්‍රමය<br>ප්‍රායෝගික ක්‍රමය | විරිත් වලට අයත් තිත් රූප සොයන්න. | සේ ගී වල දැකිය හැකි ලක්ෂණ පිළිබඳ ව පත්‍රිකාවක් සකස් කරන්න. | ලියා ඇති ලක්ෂණ පිළිබඳව විමර්ශනය කිරීම. |
| | | සේ ගී 02 ක් ගායනය<br>- සැළලිහිණි සංදේශය<br>- ගුත්තිල කාව්‍යය | ප්‍රායෝගික ක්‍රමය<br>අනුකරණ ක්‍රමය | පුහුණුවීම් වල යෙදෙන්න. | සේ ගී ඇසුරු කර ඇති සරල ගීයක් නිර්මාණය කරන්න. | නිවැරදි නාද මාලාව තහවුරු කර ඇද්දැයි ගායනය කරවා බැලීම. |
| **06** | ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | ජන ගී වර්ගීකරණය | සාකච්ඡා ක්‍රමය | ජන ගී වර්ගීකරණය අනුව ඊට අදාළ වෙනත් ජන ගී පුස්තකාලයේ පොත් වලින් සොයන්න. | විවිධ වර්ගවලට අයත් ජන ගී වගුගත කරන්න. | ජන ගී වගුගත කිරීම නිවැරදිතාවය බැලීම.<br>තෝරාගත් ජන ගී කීපයක නාද මාලා ගායනය කරවීම. |
| | | ආසාතාත්මක බැති ගී හා කෙළි ගී | ප්‍රායෝගික ක්‍රමය | සාමූහිකව පුහුණු වන්න. | මෙම ගී වර්ග 2 අතර දක්නට ඇති සම විෂමතා ලියන්න. | නිවැරදි නාද මාලාව ග්‍රහණය කර ඇති දැයි ගායනා කරවීම. |
| | | අනාසාතාත්මක ගී | ප්‍රායෝගික ක්‍රමය | තව දුරටත් පුහුණුවීම් වල නිරත වන්න. | ආසාතාත්මක හා අනාසාතාත්මක ගී අතර දක්නට ඇති වෙනස්කම් ලියන්න. | අනාසාතාත්මක ගීයක් ගායනා කරවීම. (තනි තනිව) |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| 07 | විවිධ ශෛලීන් ආභාෂය කරගත් නව නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කර ගනිමින් ගායනයේ යෙදෙයි. | නව නාට්‍ය ගී සඳහා නාඩගම් ශෛලියේ ආභාෂය ලැබීම. | ප්‍රායෝගික ක්‍රමය සාකච්ඡා ක්‍රමය | අන්තර්ජාලය භාවිතා කරමින් මෙම නාට්‍ය ගී නැරඹීමට උත්සාහ ගන්න. | මනමේ, සිංහබාහු, කාලගෝල නාට්‍යයන්හි ඇති ගීත පෙළගස්සන්න. | රංගනයත් සමඟ නාට්‍ය ගීයක් ගායනා කරන්න. |
| 08 | හින්දුස්ථානී තාලපද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත්වන අයුරු විමර්ශනය කරමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | හින්දුස්ථානි තාල පදවල අවනද්ධාක්ෂර | ප්‍රායෝගික ක්‍රමය සාකච්ඡා ක්‍රමය | තබ්ලා හස්ත සාධන අභ්‍යාස ඇතුලත් වීඩියෝ පට නරඹන්න. තබ්ලා වාදන ඇතුළත් වීඩියෝ - අන්තර්ජාලය ඇසුරෙන් නරඹන්න. | තබ්ලාවේ හඬ නිවැරදිව ඉපදීමට අවශ්‍ය අංග මොනවාදැයි ලියා දක්වන්න. | තබ්ලාවේ දායන් හා බායන් තුළින් උපදින තබ්ලා අක්ෂර 06 ක් වාදනය කර පෙන්වන්න. |
| 09 | ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි. | W.Bමකුලොළුව මහතා සී.ද.ඇස්.කුලතිලක මහතා | සාකච්ඡා ක්‍රමය | පුස්තකාලයේ ඇති පොත් පරිශීලනය කරමින් මෙම සංගීතඥයින් පිළිබඳ තව දුරටත් කරුණු රැස් කරන්න. | මෙම සංගීතඥයින් සංගීත ක්ෂේත්‍රයට කළ සේවය පිළිබඳ පුවත්පතකට ලිපියක් සකස් කරන්න. | කෙටි ප්‍රශ්න පත්‍රයක් ලබා දීම මගින් |

## දියමන්ති ව්‍යාපෘතියට අදාළ සමාජීය විද්‍යා විෂයයන් වල අධ්‍යයන ඉලක්ක.
## (සබරගමු පළාතේ සියලු පාසල් සඳහා)

**දෙවන අදියර**

**10 ශ්‍රේණිය**

**තුන්වන වාරය - පෙරදිග සංගීතය**

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **10** | නාදයේ විවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි. | නාද නිෂ්පත්තිය හා ප්‍රගමණය | සාකච්ඡා ක්‍රමය | විද්‍යා ගුරුවරයා හා විද්‍යාගාරය ඇසුරු කරමින් තවදුරටත් මේ පිළිබඳව තහවුරු කර ගැනීම. | නාදය හා බැඳී පවතින විද්‍යාත්මක සංකල්ප පිළිබඳ කෙටි විස්තර ඇතුළත් පත්‍රිකාවක් සකස් කරන්න. | කෙටි ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලියවීම. |
| | | නාදයේ ත්‍රිවිධ ගුණ | සාකච්ඡා ක්‍රමය ප්‍රායෝගික ක්‍රමය | විද්‍යාගාරයට ගොස් තවදුරටත් මේ පිළිබඳව හදාරන්න. | නාදයේ ගුණ ඇතිවන ආකාරය විවිධ උදාහරණ ගෙන පෙන්වන්න. (ලිඛිතව) | රචනාමය ප්‍රශ්න පත්‍රයක් යොමු කිරීම. |
| | | සප්තකයේ ස්වර සංඛ්‍යාත | ප්‍රායෝගික ක්‍රමය | නාදයේ සංඛ්‍යාත ඇතිවන ආකාරය විද්‍යාත්මකව තහවුරු කරගැනීමට තවදුරටත් විද්‍යා විෂයේ ගුරුවරයාගෙන් විමසන්න. | නාදයක හා ශබ්දයක ඇතිවන තරංගවල ස්වභාවය රූප සටහනක් මඟින් දක්වන්න. | බහුවරණ ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලියවීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **11** | උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණකරණයේ රාගධාරී පසුබිම | ගයා වයා විඳිමු හින්දි චිත්‍රපට ගී | ප්‍රායෝගික ක්‍රමය | DVD, CD, VCD ආදී උපාංග මගින් හින්දි චිත්‍රපට ගී නරඹන්න. | හින්දි චිත්‍රපට ගී වල ඇති විශේෂ ලක්‍ෂණ මැයෙන් බිත්ති පුවත්පතකට ලිපියක් සාදන්න. | තනි තනිව ගීතයක් ගායනය කරවීම. |
| | | මව්පිය ගුණවරුණ ගී | ප්‍රායෝගික ක්‍රමය | මව්පිය ගුණ ඇතුළත් ගී ලැයිස්තුවක් සොයා සකස් කරන්න. | මව්පිය ගුණ ඇතුළත් ගීයක් ගෙන එහි පද මාලාව, තනුව, අර්ථය යොදාගත් භාණ්ඩ ගායකයා ආදිය පිළිබඳ විමර්ශනාත්මක ලිපියක් ලියන්න. | මව්පිය ගුණ ඇතුළත් ගීයක් ගයන්න. |
| **12** | ගී පද රචනාවක් සුවිශේෂ ලක්‍ෂණ හඳුනා ගනිමින් ගී පද නිර්මාණය කර තනු නිර්මාණය කරයි. | ගී පද නිමවුම | ප්‍රායෝගික ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය | සාර්ථක ගී පද රචකයින්ගේ ගී පද මාලා කියවන්න. | තමන් තෝරාගත් මාතෘකාවක් යටතේ ගී පද මාලාවක් නිර්මාණය කරන්න. | නිර්මාණය කරන ලද ගී පද මාලාවේ සාර්ථකත්වය බැලීම. |
| | | සුදුසු තනු නිර්මාණය කිරීම. | ප්‍රායෝගික ක්‍රමය | හොඳ ගීත ලැයිස්තුවක් දී ඒවා ශ්‍රවණය කිරීමට යොමු කිරීම. | පදමාලාවට උචිතව තනුව යෙදී ඇති සාර්ථක නිර්මාණ 10 ක් පෙළ ගස්සන්න. | ගීත ලැයිස්තුව |
| | | කවියක් ගීතයක් කිරීම. | ප්‍රායෝගික ක්‍රමය | ගීත ලැයිස්තුවක් දී ඒවා ශ්‍රවණයට යොමු කිරීම. | පද මාලාවක් නිර්මාණය කර එයට සුදුසු තනුවක් යොදන්න. | තනුව යොදන ලද ගීතය |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **13** | ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි. | ජප්තාල් හා දීප්චන්දි තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම. | ප්‍රායෝගික ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය | ජප් තාලයට හා දීප්චන්දි තාලයට ගමන් කරන ගීත සොයන්න. | මෙම තාල වලට නිර්මාණය වූ ගීත 02 බැගින් ගෙන ප්‍රස්තාර කරන්න. | ප්‍රස්තාර කරන ලද ගී |
| | | සම ග්‍රහ, විෂමග්‍රහ, අවග්‍රහ සහිත ගී පද ප්‍රස්තාර කිරීම. | ප්‍රායෝගික ක්‍රමය | විවිධ මාධ්‍යයන්ගෙන් ප්‍රචාරය වන ගීත අසා මෙම කොටස් 03 ට යොදා ගෙන එන්න. | ශ්‍රවණය කරමින් සමග්‍රහ, විෂම ග්‍රහ, අවග්‍රහ යන කොටස් 03 ට අයත් ගීතය බැගින් ප්‍රස්තාර කරන්න. | ප්‍රස්තාර කරන ලද ගී |
| **14** | සංගීත අධ්‍යයනයේ, නිර්මාණයේ සහ සංරක්ෂණයේදී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම් වල යෙදෙයි. | E – Learning<br>E – Encyclopedia<br>E – Music (MIDI) | සාකච්ඡා ක්‍රමය<br>ප්‍රායෝගික ක්‍රමය | පරිගණක ඇසුරෙන් අධ්‍යයනය කරන්න. | මෙම සංකල්ප පැහැදිලි කර දක්වන්න. | වාචික ප්‍රශ්න මඟින් |
| | | Riping Music with computer | ප්‍රායෝගික ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය | CD, VCD, $MP^3$, Blue Ray ආදිය මගින් සංගීත නිර්මාණ ශ්‍රවණය කරන්න. පරිගණකය හරහා සංගීත නිර්මාණ කරන ආකාරය සොයන්න. | පරිගණකය හරහා සංගීත නිර්මාණයක් කරනු ලබන ආකාරය ඔබට හැකි අයුරින් ලියා දක්වන්න. | පරිගණකය යොදා ගනිමින් සංගීත නිර්මාණයක් කරන්න. |
| | | අන්තර්ජාලය ඇසුරින් සංගීතය ඉගෙන ගැනීම හා සෙවීම. | ප්‍රායෝගික ක්‍රමය | අන්තර්ජාලය ඇසුරින් සංගීත විෂය සම්බන්ධ තොරතුරු අධ්‍යයනය කරන්න. | අන්තර්ජාලය ඇසුරෙන් සංගීතය සම්බන්ධ තොරතුරක් සොයා ලියාගෙන එන්න. | ලියා ඇති තොරතුරුවල නිවැරදිතාවය සෙවීම. |

| අනු අංක | ඒකකය | අනු ඒකකය | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | අතිරේක කියවීම් හෝ විමර්ශනය සඳහා යොමු කිරීම | පැවරුම් | ඇගයීම් |
|---|---|---|---|---|---|---|
| **15** | ශ්‍රී ලංකාවේ සංගීතයේ උන්නතියට දායක වූ මෙරට සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රස විඳියි. | ලයනල් රංවල මහතා<br>රෝහණ බැද්දගේ මහතා | ප්‍රායෝගික ක්‍රමය<br>සාකච්ඡා ක්‍රමය | පුස්තකාල පොත් මගින් වැඩිදුරටත් කරුණු රැස් කරන්න. අන්තර්ජාලයෙන් තොරතුරු රැස් කරන්න. | මෙම සංගීතඥයින් විසින් කරන ලද නිර්මාණ වගුගත කර දක්වන්න. | වගුගත කර ඇති විස්තර පත්‍රිකාව |
| **16** | උතුරු ඉන්දීය අධ්‍යතන ශාස්ත්‍රීය සංගීතඥයින් හඳුනා ගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි. | හරිප්‍රසාද් චෞරසියා<br>රවි ශංකර්<br>ශකීර් හුසේන්<br>ජග්ජිත් සිං<br>A.R. රහුමාන් යන සංගීතඥයින් | සාකච්ඡා ක්‍රමය | අන්තර්ජාලය මගින් මෙම සංගීතඥයින්ගේ නිර්මාණ හා තොරතුරු ගවේෂණය කරන්න. | මෙම සංගීතඥයින් පිළිබඳ ජීවන තොරතුරු, සංගීතයට කරන ලද සේවය, කරන ලද නිර්මාණ ආදී විස්තර ඇතුලත් කර වගුවක් සකස් කරන්න. | විස්තර ඇතුළත් වගුව |